රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2015

මගේ අංකය : IAD/GA01/24
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.07.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය ආයතන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම

"මතින් නිදහස් රටක්" යන පරමාර්ථය පෙරදැරි කොට ගෙන ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් 2015 ජූලි මස 09 දින සිට අගෝස්තු මස 08 දින දක්වා දිවයින පුරා ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත ය. මෙම වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සියලුම රාජ්‍ය ආයතන මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර ස්ථාන බවට පත් කිරීම උදෙසාත් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

I. රාජ්‍ය ආයතනවල මත්ද්‍රව්‍ය භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් වන අතර මත්ද්‍රව්‍ය භාවිතය දිරි ගන්වන සුලු දැන්වීම් වක්‍ර හෝ සෘජු ප්‍රචාරණය තහනම් වේ.

II. කාර්යාල තුළට මත්ද්‍රව්‍ය, දුම්වැටි, විෂ මත්ද්‍රව්‍ය ගෙන ඒම, එයට අනුබල දීම, අලෙවිය සපුරා තහනම් වන අතර කාර්යාල පරිශ්‍රය තුළ මධ්‍යසාර, දුම්වැටි, විෂ මත්ද්‍රව්‍ය හා ඖෂධ අනිසි භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් ය.

III. රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු තුළ සංවිධානය කරනු ලබන උත්සව, රාජකාරී ගමන් වැනි අවස්ථාවල දී මත්ද්‍රව්‍ය භාවිතය සපුරා තහනම් කළ යුතු ය.

IV. මත්ද්‍රව්‍ය භාවිතය නිසා වෘත්තීමය ගෞරවයට ඇති වන හානිය හා ඵලදායිතාවට වන හානිය පිළිබඳව රාජ්‍ය නිලධරයන් දැනුම්වත් කළ යුතු අතර මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ නිලධරයන් සිටිනම් ඔවුන් උපදේශන ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා යොමු කළ යුතු ය.

V. මත්ද්‍රව්‍ය ප්‍රචාරණය වන සුලු දර්ශන ඇතුළත් පුවරු, චිත්‍ර නිර්මාණයන් ආයතන පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම සම්පූර්ණයෙන් තහනම් කිරීමට පියවර ගත යුතු වේ.

VI. මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු හා ප්‍රචාරණ වැඩ සටහන් ආයතන තුළ පවත්වා ගෙන යාමට ක්‍රියා කළ යුතු ය.